# එක්සත් ජනපදය ශ්‍රී ලංකාව තුල මිලිටරි මැදිහත්වීමක් සැලසුම් කරයි

## US plans for military intervention in Sri Lanka

**විජේ ඩයස් විසිනි**
**2009 මාර්තු 4**

හමුදාව සහ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර පවතින තියුනු සටන්වලට කොටු වී සිටින සිවිල් ජනයා ඉවත් කරගැනීමේ මුවාවෙන් දිවයිනේ උතුරේ යුද කලාපයට එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත මිලිටරි මෙහෙයුමක් පිලිබඳ සැලසුම්, ශ්‍රී ලංකාවේ සන්ඩේ ටයිම්ස් පත්‍රය, එලිදරව් කර තිබේ.

පුවත්පතට අනුව, කර්තව්‍යය සිදු කෙරෙනු ඇත්තේ එක්සත් ජනපද පැසිෆික් අන දෙන මධ්‍යස්ථානයට (පැකොම්) අනුබද්ධිත මෙරයින් කාර්යසාධන සේනාංකයක් විසිනි. එක්සත් ජනපද නාවික හා ගුවන් හමුදා ද එයට සහභාගි වනු ඇත. මෙහෙයුම සඳහා මාවත සකසනු වස් ඉහල පෙලේ පැකොම් කන්ඩායමක් කොලඹ සංචාරයක යෙදුනු බව පෙබරවාරි 22 දා පල වූ පුවත්පතේ ආරම්භක ලිපිය වාර්තා කලේය.

ඔබාමා පාලනාධිකාරය හෝ එක්සත් ජනපද මිලිටරිය කිසිදු නිවේදනයක් නිකුත් කොට නැති වුවත් ශ්‍රී ලංකා විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම සන්ඩේ ටයිම්ස් පත්‍රයට පැවසුවේ, සැලසුම් කල එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත "සන්ධාන මානුෂීය කාර්යසාධක බලකාය" ගැන තමන් දන්නා බවයි. ප්‍රන්සය ද සිවිල් ජනයා ඉවත් කරගැනීම පිනිස ආධාර කිරීමට කැමැත්ත පල කර ඇතැයි විදේශ ඇමති පසුගිය සති අන්තයේ දී පුවත්පතට පැවසීය. සිවිල් ජනයා ඉවත් කරගැනීමේ තමන්ගේ ම සැලසුමක් පිලිබඳ යෝජනාවක් ඉදිරිපත් කර ඇති ඉන්දියාව පසුගිය සතියේ දී ඒකාබද්ධ මෙහෙයුමකට සිය සහයෝගය ලැබෙන බව පෙන්නුම් කලේය.

සිවිල් ජනයා ඉවත් කරගැනීම පිලිබඳ මොන යම් හෝ ආකාරයක සැලසුමක් පිලිබඳ ආන්ඩුව හා එල්ටීටීඊය අතර කිසිදු එකඟතාවක් ඇති කරගෙන නැත. දෙපාර්ශ්වයම කොටු වී සිටින සිවිල් ජනයා දේශපාලන ඉත්තන් ලෙස යොදා ගනිති. හමුදාව, ප්‍රදේශය මුලුමනින්ම ප්‍රහාරයකට ලක් කරනු පිනිස ඉතිරිව පවත්නා එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශයෙන් සිවිල් ජනයා පලවා හැරීමට උත්සාහ දරමින් සිටී. බිත්තියටම හේත්තු වී සිටින එල්ටීටීඊය, සිවිල් ජනයාට පිටව යාමට ඉඩ දීමට ප්‍රථමයෙන් සටන් විරාමයක් හා සාකච්ඡා ඉල්ලා තිබේ. පරිපූර්න, කොන්දේසි විරහිත යටත්වීමක් ඉල්ලා සිටින ආන්ඩුව එම පියවර ප්‍රතික්ෂේප කලේය.

එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත මෙහෙයුම එල්ටීටීඊයේ එකඟතාව නොමැතිව ඉදිරියට යා හැකි බවට සන්ඩේ ටයිම්ස් පත්‍රය ඇඟවුම් කලේය. එය වනාහි එක්සත් ජනපද මෙරයින් හමුදා සහ ගරිල්ලන් අතර ගැටුම් ඇවිලවීමේ විභවයෙන් යුක්ත ප්‍රකෝපකාරී පියවරකි. "එල්ටීටීඊයේ අඛන්ඩ ප්‍රතික්ෂේප කිරීම්, එල්ටීටීඊයේ විරුද්ධත්වයන් නොතකා මානුෂීය අභ්‍යාසය ක්‍රියාවට දැමීමට අවසර දෙනු වස් ආන්ඩුවට බල කල හැකි යයි සන්ඩේ ටයිම්ස් පත්‍රයට දැනගන්ට ලැබී ඇත." යයි එය සඳහන් කලේය.

දැන් වර්ග කිලෝමීටර් 50කට අඩු ප්‍රදේශයකට ලඝු කෙරී පවතින එල්ටීටීඊ-පාලිත භූමිය තුල දෙමල සිවිල් වැසියන් 200,000ක තරම් විශාල පිරිසක් කොටු වී ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (අයිසීආර්සී) තක්සේරු කරයි. හමුදාවේ ෂෙල් ප්‍රහාර මගින් සිය ගනනක් ඝාතනයට ලක්ව හා තුවාල ලබා ඇත. මිලිටරිය අවසර දී ඇත්තේ සීමිත ආහාර සැපයුම් සඳහා පමනි. පලා යන සිවිල් වැසියන්ට එල්ටීටීඊ සටන්කරුවන් වෙඩි තබා ඇති අතර, ඉදිරි ආරක්ෂක වලල්ල තරනය කිරීමට සමත් වන අය රැඳවුම් කඳවුරු තුල රඳවා ගනු ලැබේ.

දැන් ක්‍රියාත්මක නොවන ශ්‍රී ලංකාවේ "සාම ක්‍රියාදාමය" අධීක්ෂනය කරන ආධාර දෙන සම-සභාපතිවරු ලෙස ප්‍රසිද්ධ ජාත්‍යන්තර කන්ඩායමේ සාමාජිකයන් -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ -- මෙම මානුෂීය ව්‍යසනය පිලිබඳව උත්සුකතා ප්‍රකාශයට පත් කර ඇත. කෙසේවෙතත්, ඔවුන්ගේ නොසන්සුන්කම, සරනගතයන්ගේ ඉරනම පිලිබඳ මොන යම් හෝ අව්‍යාජ සහානුමතියක් සමග කිසිදු සම්බන්ධයක් නැත. එය මෙහෙයවෙන්නේ, උතුරු ශ්‍රී ලංකාවේ ලේ වැගිරීමක් කලාපය පුරා ප්‍රගාඪ අස්ථායිකරන බලපෑමක් නිර්මානය කරනු ඇති බවට පවත්නා භීතිය මගිනි.

ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින් 2006 මැද දී යුද්ධය යලි දියත් කල විට, ඔහුට ඔවුන් දුන් නිහඬ

පිටුබලය මගින් ඊනියා සම-සභාපතිවරුන්ගේ කුහකත්වය දැකගත හැකිය. සිවිල් වැසියන් දහස් ගනනක් දැනටමත් ඝාතනයට ලක්ව ඇත. ලක්ෂ ගනනක් සිය නිවාසවලින් පලවා හරිනු ලැබ ජරාජීර්න සරනගත කඳවුරුවල ජීවත් වෙති. මිලිටරියේ අනුග්‍රහය ලබන ඝාතක කල්ලි සිය ගනනක් -- දෙමල තරුනයන්, විපාර්ශ්වික දේශපාලනඥයන්, මාධ්‍යවේදීන් හා ආධාර සේවකයන් -- මරා දමා ඇත්තේ දන්ඩනයට ලක්වීමේ කිසිදු භීතියකින් තොරවය." සාම ක්‍රියාදාමයේ අධීක්ෂනය කරන එම බලවතුන් මේ කිසිවක් සම්බන්ධයෙන් යන්තම් කෙඳිරිල්ලක් හෝ නගා නැත.

තථ්‍ය වසයෙන් ගත් කල, එක්සත් ජනපද නායකත්වයෙන් යුක්ත "මානුෂීය මෙහෙයුම", සිවිල් ජනයා ත්‍රස්ත කිරීමට, ඔවුන් එල්ටීටීඊ-පාලිත ප්‍රදේශවලින් පලවා හැරීමට සහ එම ප්‍රදේශ නිදහසේ ප්‍රහාර එල්ල කල හැකි කලාපයක් බවට පත්කර ගැනීමට ඉවබවක් නැති කාලතුවක්කු සහ ගුවන් බෝම්බ ප්‍රහාර යොදා ගෙන ඇති ශ්‍රී ලංකා මිලිටරියේ උපක්‍රම සමග, පහසුවෙන් ම ගැලපෙයි. දිවයිනේ උතුරේ හා නැගෙනහිර එල්ටීටීඊ මර්මස්ථාන අල්ලාගැනීම තුල දී පසුගිය දෙවසර තිස්සේ මිලිටරිය මෙම විධික්‍රමය නැවතනැවතත් යොදා ගෙන තිබේ.

කෙසේවෙතත්, එක්සත් ජනපදයට ශ්‍රී ලංකාව තුල තමන්ගේම මූලෝපායික න්‍යාය පත්‍රයක් ඇත. බුෂ් පාලනාධිකාරය රාජපක්ෂගේ "ත්‍රස්ත විරෝධී යුද්ධයට" සහාය දුන්නේ, දකුනු ආසියාව තුල, විශේෂයෙන් ම, කලාපය තුල වොෂිංටනයේ වඩාත්ම වැදගත් මූලෝපායික හා ආර්ථික හවුල්කරු බවට පත්වෙමින් සිටින, ඉන්දියාව තුල, අස්ථායිකරන බලපෑමක් ඇති කරන යුද්ධයක් අවසන් කිරීමේ විධික්‍රමයක් ලෙසය. 25-අවුරුදු යුද්ධය එල්ටීටීඊ "ත්‍රස්තවාදයේ" නොව, දිවයිනේ දෙමල සුලුතරයට එරෙහිව වෙනස්කම් කිරීමේ දශක ගනනාවක නිල පිලිවෙතෙහි, නිෂ්පාදිතයකි.

පසුගිය වසර අග දී එල්ටීටීඊයට එරෙහිව හමුදාව අත්පත් කරගත් ජයග්‍රහනවලට ඉක්බිතිව, එක්සත් ජනපදය, ඉන්දියාව සහ යුරෝපා බලවතුන්, රාජපක්ෂ ආන්ඩුවට වඩවඩා අවධාරනාත්මකව බල කර සිටියේ, යුද්ධය අවසන් කරනු වස් "දේශපාලන විසඳුමක්" ගෙනඑන ලෙසයි. මෙම පදය මගින් අදහස් කෙරෙන්නේ, එල්ටීටීඊය සමග සාකච්ඡා පැවැත්වීම නොවේ. එවන් සාකච්ඡා වොෂිංටනය විසින් විශේෂයෙන් ම බැහැර කරනු ලැබ ඇත. ඒ වෙනුවට එයින් අදහස් කෙරෙන්නේ, දිවයිනේ සිංහල හා දෙමල ප්‍රභූ කොටස් අතර සම්මුතියකි. ඔවුන්ගේ භීතියට හේතු වී ඇත්තේ, එවන් සම්මුතියකින් තොර වූ කල, පලමුකොටම යුද්ධයට තුඩු දුන් පැසෙන වාර්ගික ආතතීන් වෙනත් රූපාකාරයකින් යලිත් පැනනගිනු ඇත යන්නයි.

පසුගිය සතියේ දී, එක්සත් ජනපදයේ සෙනෙට් සභාවේ විදේශ සබඳතා කමිටුව, මෙම උත්සුකතා සාකච්ඡා කරනු වස් රැස්විය. ශ්‍රී ලංකාවේ ආන්ඩුව දැන් ගන්නා තීන්දු එලඹෙන දශක ගනනාවකට එම දිවයින සම්බන්ධයෙන් බලපානු ඇතැයි ශ්‍රී ලංකාවේ හිටපු එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටඩ් කමිටුව හමුවේ පැවසීය. "එය එහි දෙමල සිවිල් වැසියන්ට මනා ලෙස සැලකීමට අපොහොසත් විය හැකිය, දේශපාලන ප්‍රතිසංස්කරනවල බැරෑරුම්ව නිමග්න වීමට අපොහොසත් විය හැකිය, මානව හිමිකම් උල්ලංඝනය වීමට දිගටම ඉඩ දෙනු ඇත, විපරීමතධාරීන් තර්ජනයට ලක් විය හැකිය. එසේ වුව හොත්, අසහනය දිගටම පවතිනු ඇත, ප්‍රචන්ඩත්වය නිසැකවම යලි මතුවනු ඇත, යන්තම් අත ලඟ යයි නිරතුරුවම පෙනී ගිය බලාපොරොත්තු දනවන අනාගතය තවත් ඈතට පසුබසිනු ඇත." යයි ඔහු අනතුරු ඇඟවීය.

"ශ්‍රී ලංකාවේ අනාගතය හැඩගැස්වීමෙහිලා වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කිරීමට" ලන්ස්ටඩ් එක්සත් ජනපදයට කැඳවුම් කලේය. දැවැන්ත මිලිටරි වියදම් සහ දැන් ගෝලීය ආර්ථික පසුබෑස්ම මගින් නිර්මිත ශ්‍රී ලංකාවේ බැරෑරුම් මූල්‍ය අර්බුදය ගැන හොඳින් දන්නා, ලන්ස්ටඩ්, "දැඩි කොන්දේසි ඉටු කල හොත් පමනක්" ආධාර" ගලා එනු" ඇතැයි ජාත්‍යන්තර ආධාර ආයතන අවධාරනය කල යුතු යයි යෝජනා කලේය. වාර්ගික ආතතීන් ලිහිල් කරනු වස් අවශ්‍ය සිය "ප්‍රතිසංස්කරන" දල වසයෙන් විස්තර කිරීමෙන් පසුව, ඔහු මෙසේ සමාප්ත කලේයඃ "එවන් වෙනස්කම් නොමැති කල, බලාපොරොත්තු විය හැක්කේ, ජනවාර්ගික ගැටුම් නොවැලැක්විය හැකි ලෙස යලි පැනනැගීමකි."

කෙසේවෙතත්, දෙමල ජනයාට එරෙහි වෙනස්කම් කිරීමේ නිල පිලිවෙත අවසන් කිරීමේ ද දිවයිනේ සිංහල හා දෙමල ප්‍රභූන් අතර බලය බෙදා ගැනීමේ සැකැස්මක් ද සඳහා ලන්ස්ටඩ් කරන යෝජනාව ය, හරියටම අනුප්‍රාප්තික කොලඹ ආන්ඩුවලට සාක්ෂාත් කිරීමට නොහැකි බවට ඔප්පු වී ඇත්තේ. 1948 නිදහසේ පටන් මේ දක්වා, ශ්‍රී ලංකාවේ ධනේශ්වරය, කම්කරු පන්තිය භේද කිරීමේ ද ස්වකීය පාලනය රැක ගැනීමේ මුක්කුවක් ලෙස ද සිංහල අධිපතිවාදය මත පාදක වී තිබේ. එල්ටීටීඊයට එරෙහි මෑත මිලිටරි ජයග්‍රහන, දෙමල ජනයාට දෙන මොන යම් හෝ සහනයක් සිංහල බෞද්ධ ජාතිය පාවාදීමක් ලෙස සලකන කොලඹ දේශපාලන සංස්ථාපිතයේ වඩාත්ම ප්‍රතිගාමී කොටස්වල අත තව දුරටත් ශක්තිමත් කරනු ඇත.

මෙම සන්දර්භය තුල, දිවයිනේ උතුරේ සැලකිය යුතු එක්සත් ජනපද මිලිටරි හමුදාවක් පැවතීම මගින්, යුද්ධයේ අවසන් ප්‍රතිඵලය තම මූලෝපායික අවශ්‍යතාවන්ට අනුව හැඩගැස්වීමෙහිලා, කොලඹ පාලනය මත යෙදවිය හැකි සැලකිය යුතු මට්ටමේ දේශපාලන ලීවරයක් වොෂිංටනයට සැපයෙනු ඇත.

ලන්ස්ටඩ් මිලිටරි මැදිහත්වීමක් ගැන ඇඟවුම් කලේ නැති වුවත්, ශ්‍රී ලංකාව තම ආනුභාව ක්ෂේත්‍රයේ කොටසක් ලෙස සාම්ප්‍රදායිකව සලකා ඇති “ඉන්දියාව සමග සමීප සම්බන්ධීකරනයකින්” එක්සත් ජනපද ක්‍රියාමාර්ග ක්‍රියාවට දැමීමට සිදු වනු ඇතැයි ඔහු අවධාරනය කලේය. ශ්‍රී ලංකාවේ යුද්ධය සම්බන්ධයෙන් දකුනු ඉන්දියාවේ දෙමල ජනයා අතර වැඩෙන දේශපාලන අසහනය ඉන්දියානු ආන්ඩුව අස්ථාවර කිරීමේ ද එක්සත් ජනපද-ඉන්දියානු මූලෝපායික හවුලට බලපෑමේ ද විභවයෙන් යුක්ත ය යන කාරනාව එක්සත් ජනපදයේ භීතියට හේතු වී ඇත.

ඉන්දියාව පිලිබඳ උත්සුකතා, ශ්‍රී ලංකාව තුල එක්සත් ජනපද මිලිටරි මැදිහත්වීමක් සඳහා ගාමකය සපයන එකම සාධකය නොවේ. දකුනු ආසියාව හා ඉන්දියානු සාගරය තුල මෙහෙයුම් සඳහා පදනමක් ලෙස දිවයින මත පා-රැකුලක් තහවුරු කරගනු වස් දශක ගනනාවක් තිස්සේ, පෙන්ටගනය උත්සාහ කර ඇත. වත්මන් සටන් පවතින ප්‍රදේශවලට දකුනින්, නැගෙනහිර වෙරලේ පිහිටි, ත්‍රිකුනාමලයේ දියඹ වරාය දිගු කලක් තිස්සේ මූලෝපායික ත්‍යාගයක් ලෙස සැලකී ඇත. එය වනාහි 2002 දී ශ්‍රී ලංකාවේ සමීක්ෂනයක යෙදුනු එක්සත් ජනපද පැකොම් කන්ඩායමක් විසින් මතුකරන ලද කාරනාවකි. 2004 ව්‍යසනකාරී සුනාමියට පසුව, එක්සත් ජනපද මිලිටරිය දකුනු ශ්‍රී ලංකාවට මෙරයින් බල ඇනියක් එවමින්, වත්මන් “මානුෂීය” සැලසුම්වලට වැදගත් පූර්වාදර්ශයක් තහවුරු කලේය.

ඉන්දියානු සාගරයේ ද එබැවින් ශ්‍රී ලංකාවේ ද දිගු කාලීන භූ-දේශපාලනික අර්ථභාරය, ෆොරීන් එෆෙයාර්ස් නම් එක්සත් ජනපද සඟරාවේ මෑතම කලාපයේ පලවූ “විසි එක් වන සියවස සඳහා මධ්‍ය වේදිකාවඃ ඉන්දියානු සාගරය තුල බල ක්‍රීඩා” යන මැයෙන් යුක්ත ලිපියක් මගින් අවධාරනය කෙරුනි. කෘතහස්ත මාධ්‍යවේදියකු වන රොබර්ට් කප්ලාන් ආසියාව තුල එක්සත් ජනපදය මුහුන දෙන එකිනෙකට සම්බන්ධිත භූ-දේශපාලනික අභියෝග තුනක් හඳුනාගත්තේයඃ “වඩා පුලුල් මැද පෙරදිග පිලිබඳ මූලෝපායික නපුරු සිහිනය, පැවති සෝවියට් සංගමයේ දකුනු ස්ථම්බය මත ආනුභාවය සඳහා වන අරගලය, සහ ඉන්දියානු සාගරය තුල ඉන්දියාවේ හා චීනයේ වැඩෙන පැවැත්ම”

ඉන්දියානු සාගරය තුල චීනයේ හා ඉන්දියාවේ නැගෙන නාවික බලය, සාගරයේ වෙලඳ මාර්ගවල වැදගත්කම, යාබදව පිහිටි මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ බල ශක්ති සම්පත්වලින් පොහොසත් කලාපවල මූලෝපායික අර්ථභාරය, සහ කලාපය තුල එක්සත් ජනපදයේ ආනුභාවයේ සාපේක්ෂ පහල බැසීමේ අන්තරායන් පිලිබඳව ලිපිය අවධාරනය කලේය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එය මෙසේ සඳහන් කලේයඃ “අරාබි මුහුද හා බෙංගාල බොක්ක හමුවන ස්ථානයේ මූලෝපායිකව පිහිටි ශ්‍රී ලංකාව තුල, පදනම් ස්ථානයක් තහවුරු කරගැනීමට සලකාබැලීමෙන් එක්සත් ජනපද අද්මිරාල්වරු ඉවතට හැරවීමට ජනවාර්ගික යුද්ධයේ දර්ශනය හේතු වී ඇති තතු යටතේ, චීන්නු සිය යුද නෞකා සඳහා ඉන්ධන පිරවීමේ මධ්‍යස්ථානයක් එහි ගොඩනැගීමේ යෙදී සිටී.”

ඉන්දියානු සාගරය මත වඩා පුලුල් මූලෝපායික යොමුවක් සඳහා පවත්නා අවශ්‍යතාව නිසැකවම දිවයින තුල එක්සත් ජනපද මිලිටරි මැදිහත්වීමකට පිටුපසින් පවතින ප්‍රධාන ගාමකයකි. ශ්‍රී ලංකාව තුල මොන යම් හෝ එක්සත් ජනපද මිලිටරි මෙහෙයුමක දී සැලකිල්ලට භාජනය වීමට ඉඩක් නොමැති කාරනය නම්, උතුරේ කොටුවී සිටින දෙමල සිවිල් ජනයාගේ ඉරනමයි. ඇෆ්ඝන් හා ඉරාක ජනතාව සඳහා ව්‍යසනයන් බවට පත්ව ඇති ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ එක්සත් ජනපද ආක්‍රමනවල දී මෙන් ම, ශ්‍රී ලංකාව තුල මැදිහත්වීමක් ද එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ මූලෝපායික හා ආර්ථික අවශ්‍යතා ඉදිරියට ගෙනයාමට උත්සාහ කරනු ඇති අතර එවන් මැදිහත්වීමකට ශ්‍රී ලංකාවේ, දකුනු ආසියාවේ හා ජාත්‍යන්තර කම්කරු පන්තිය විරුද්ධ විය යුතුය.

© www.wsws.org